# සංක්ෂිප්තය

අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් ඉගැන්වීම් පුහුණුවේදී මුහුණ දෙන ගැටලු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය ඔස්සේ සිදුකෙරිණි. සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුමට අනුව පර්යේෂණය සිදුකෙරිනි. අධ්‍යාපන විද්‍යාපීඨ සීමාවාසී ගුරු සිසුන්ගේ ඉගැන්වීම් පුහුණුවේ ස්වභාවය හඳුනා ගැනීම, ඉගැන්වීම් පුහුණුව පිළිබඳ සීමාවාසී ගුරු සිසුන්ගේ සංජානන විමසා බැලීම, ඉගැන්වීම් පුහුණුව ආශ්‍රිත සීමාවාසී ගුරු ශිෂ්‍යයා මුහුණ දෙන ගැටලුවල වෙනස්කම් සොයාබැලීම, සීමාවාසී ගුරු සිසුන් ඉගැන්වීම් පුහුණුවේදී මුහුණ දෙන ගැටලු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම යන ප්‍රධාන අරමුණු හතරක් ඔස්සේ අධ්‍යයනය මෙහෙයවනු ලැබීය.

නියැදිය සඳහා නිල්වලා අධ්‍යාපන විද්‍යාපීඨයේ 2013/2015 කණ්ඩායමේ සීමාවාසී පුහුණුව ලබන ගුරු සිසුන් හැටදෙනෙකු තෝරාගන්නා ලද අතර ඉන් ගුරු සිසුවියන් හතළිස්පස් දෙනෙකු අහඹු නියැදිකරණයෙන් ද, ගුරු සිසුන් පහලොස්දෙනෙකු සහේතුක නියැදිකරණය යටතේ ද තෝරාගන්නා ලදී. එසේම සීමාවාසී ගුරු පුහුණුව ක්‍රියාත්මක වන පාසල් නවයක විදුහල්පතිවරුන් නවදෙනෙකු, උපාධ්‍යවරුන් නවදෙනෙකු හා විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් දස දෙනෙකුගෙන් සමන්විත වන ලෙස සම්පූර්ණ නියැදිය අසූඅටදෙනෙකුගෙන් යුක්ත විය.

ප්‍රශ්නාවලි භාවිතයෙන් ගුරු සිසුන්ගෙන් හා උපාධ්‍යවරුන්ගෙන්ද, සම්මුඛ සාකච්ඡා භාවිතයෙන් විදුහල්පතිවරුන්ගෙන් හා කථිකාචාර්යවරුන්ගෙන් ද, ලේඛනගත වාර්තා අධ්‍යයනයෙන් ද දත්ත රැස්කර ගන්නා ලදී.

ලබාගත් දත්ත ගුණාත්මකව මෙන්ම ප්‍රතිශත, වගු, ප්‍රස්තාර ඇසුරින් ප්‍රමාණාත්මකව අරමුණුවලට අදාළව විශ්ලේෂණය කර ඉදිරිපත් කරන ලදී. දත්ත විශ්ලේෂණයෙන් ලබාගත් ප්‍රතිඵල අනුව පහත සඳහන් නිගමනයන්ට එළඹිනි. එනම්, ආරම්භක අවධියේ විද්‍යාපීඨ තුළ ක්‍රියාත්මක වූ පාඨමාලා තරමක් දුරට වෙනස්ව ක්‍රියාත්මක වන බව, පාසල් පද්ධතිය හා ගුරු සිසුන් ඉගැන්වීම් පුහුණුවේ අරමුණු විධිමත්ව තේරුම් ගෙන නොතිබීමෙන් සීමාවාසී ඉගැන්වීම් පුහුණුවේ අරමුණු ඉටුනොවන බව, අධ්‍යාපන ව්‍යවහාර විෂය යටතේ ඉගැන්වීම් පුහුණුව පිළිබඳ ලැබුණු ප්‍රායෝගික දැනුම ප්‍රමාණවත් නොවන බව, විදුහල්පති හා කථිකාචාර්යවරුන් මගින් ප්‍රමාණවත් අධීක්ෂණයක් වන බව. උපාධ්‍යවරුන් මගින් සිදුවන අධීක්ෂණය තරමක් දුරට සංවර්ධනය විය යුතු බව, කාර්යමූලික පර්යේෂණ පිළිබඳව විද්‍යාපීඨය මගින් ලබාදෙන දැනුම ප්‍රමාණවත් නොවන බව, පාසල හා විද්‍යාපීඨය අතර ප්‍රමාණවත් සන්නිවේදනයක් නොමැති බව, ගුරු මණ්ඩලයෙන් ප්‍රමාණවත් පිළිගැනීමක් නොලැබෙන බව, ගුරු ශිෂ්‍යයන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන් සම්බන්ධ ගැටලුවලට මුහුණ පාන බව, සීමාවාසී අධීක්ෂණය තවදුරටත් විධිමත්විය යුතු

බව, ඉගැන්වීම් පුහුණුව සාර්ථක කර ගැනීමට උපාධ්‍යවරයාගෙන් ලැබෙන උපදෙස් හා මගපෙන්වීම් ප්‍රමාණවත් බව හා පාසල් පරිපාලනය සම්බන්ධයෙන් ගුරු සිසුන් ලබාගන්නා දැනුම ප්‍රමාණවත් නොමැති බව යන නිගමන වේ.

ගුරු වෘත්තියට කැමැත්තක් දක්වන සිසුන් අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීම, පාඩම් සටහන් ලිවීම පිළිබඳ කථිකාචාර්යවරුන් අතර පොදු එකගතාවක් ඇති කිරීම, අධීක්ෂණ ක්‍රියාවලිය ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ඉහළ දැමීම, ඉගැන්වීම් පුහුණුව, සිදු කෙරෙන පාසල් හා විද්‍යාපීඨ අතර යහපත් සන්නිවේදනයක් පවත්වා ගැනීම, ඉගැන්වීම් පුහුණුවට අදාළ ප්‍රායෝගික දැනුම ලබා ගැනීමට වැඩසටහනක් සංවිධානය කිරීම ලෙස පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර ඇත.